**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**

# ටෙන්ඩර් දැන්වීම

# පාවිච්චි කරන ලද වාහනයක් විකිණීම

**මෙම අමාත්‍යාංශය විසින් පාවිච්චි කරන ලද පහත සඳහන් වාහනයක් විකිණීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ**

| වාහන අංකය | නිෂ්පාදිත දිනය සහ ලියාපදිංචි සහතිකය මුල් පිටපතද /අනුපිටපතද යන්න | වාහනයේ වර්ගය/ මාදිලිය | ඩීසල් වාහනයක් පෙට්‍රල් වාහනයක් ද යන්න |
|---|---|---|---|
| KA 2676 | 2005/ (මුල් පිටපත) | ටොයෝටා ලැන්ඩ් කෲසර් ප්‍රාඩෝ | පෙට්‍රල් |

- කම්කරු විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් මෙම අමාත්‍යාංශයේ පාවිච්චි කරන ලද වාහනයක් විකිණීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් කැඳවනු ලැබේ.

- මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන්ට ඕනෑම වැඩ කරන දිනයක පෙ.ව. 9.00 සිට සිට ප.ව. 3.00 දක්වා කොළඹ 5, නාරාහේන්පිට, "මෙහෙවර පියෙස" ගොඩනැගිල්ලේ පිහිටි කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ, 6 වන මහලේ පාලන අංශයේ, සහකාර ලේකම් (ප්‍රසම්පාදන) වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි ය (දුරකථන අංකය: 0112 368 136, ෆැක්ස් අංකය: 0112 368 165, විද්‍යුත් ලිපිනය: as.proc@labourmin.gov.lk)

- වාහන පරීක්ෂණ බලපත්‍රය ඇතුළුව අදාළ ටෙන්ඩර් ලියකියවිලි, 2023.09.13 සිට 2023.09.27 දක්වා ඕනෑම වැඩ කරන දිනයක දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කොළඹ 5, නාරාහේන්පිට, "මෙහෙවර පියෙස" ගොඩනැගිල්ලේ 6 වන මහලේ පිහිටි කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ, ගිණුම් අංශයේ සරප් වෙත රු. 2,000.00ක ආපසු නොගෙවන මුදලක් ගෙවා රිසිට්පත ලබාගෙන අනතුරුව එම රිසිට්පත එම මහලේ ම පිහිටි පාලන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ය.

- ටෙන්ඩර් ඉදිරිපත් කිරීම, කොළඹ 5, නාරාහේන්පිට, "මෙහෙවර පියෙස" ගොඩනැගිල්ලේ 6 වන මහලේ පිහිටි කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ, ගිණුම් අංශයේ සරප් වෙත ආපසු ගෙවන රු. 25,000.00ක තැන්පතු මුදල් ගෙවීමකට යටත් වේ.

- මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන, වාහන පරීක්ෂණ බලපත්‍රය හිමි ටෙන්ඩර්කරුවන්ට පමණක්, 2023.09.13 සිට 2023.09.27 දක්වා වැඩ කරන දිනයන්හි, පෙරවරු 10.00 සිට පස්වරු 3.00 දක්වා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ පරිශ්‍රයේ දී මෙම වාහනය පරීක්ෂා කළ හැකි වේ.

- මුද්‍රා තැබූ ටෙන්ඩර් ලියකියවිලි 2023 ඔක්තෝම්බර් මස 02 වන දින පෙ.ව.10. 00 ට හෝ ඊට පෙර, පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතු ය. ටෙන්ඩර් භාරගැනීම 2023 ඔක්තෝම්බර් මස 02 වන දින පෙ.ව.10. 00 ට අවසන් වනු ඇත. **ප්‍රමාද වූ ටෙන්ඩර් භාරගනු නොලැබේ.**

- **භාර දිය යුතු ලිපිනය :**

  **අතිරේක ලේකම් (පාලන)**
  **පාලන අංශය**
  **කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**
  **6 වන මහල, "මෙහෙවර පියෙස"**
  **නාරාහේන්පිට, කොළඹ 5**

- ටෙන්ඩර් ලියකියවිලි මුද්‍රා තැබූ ලියුම් කවරයක බහාලිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශයේ පාවිච්චි කළ වාහනය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම"** යනුවෙන් සටහන් කළ යුතු ය.

- ටෙන්ඩර්පත් කැඳවීම අවසන් වූ වහා ටෙන්ඩර් විවෘත කිරීම කොළඹ 05, නාරාහේන්පිට,"මෙහෙවර පියෙස" ගොඩනැගිල්ලේ, 6 වන මහලේ පිහිටි කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ, අතිරේක ලේකම් (පාලන) පරිශ්‍රයෙහි සිදු කෙරෙන අතර **ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නිසි බලයලත් නියෝජිතයා මෙම ස්ථානයේ සිටිය යුතු ය.** ටෙන්ඩර්කරු තෝරා ගනු ලැබුවහොත්, ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය සඳහා ඉදිරිපත් කරන වටිනාකමෙන් 25%ක් මුදලින් ඒ අවස්ථාවේ ම ගෙවිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, වාහනය සඳහා තැන්පත් කළ, ආපසු ගෙවන රු. 25,000.00ක මුදල ආපසු නොගෙවනු ඇත.

- වෙන්කරගත් වාහනය ඉතිරි මුදල ගෙවීමෙන් අනතුරුව දින තුනක් ඇතුළත අමාත්‍යාංශ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු වේ. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, වෙන් කිරීමේ ගාස්තුව වන 25% සහ ආපසු ගෙවන රු. 25,000.00ක තැන්පතුව, රාජසන්තක කිරීමට නියමිතය. තවද, ඔහු වෙනුවෙන් කරන ලද ටෙන්ඩර් ප්‍රදානය, ටෙන්ඩර් කොන්දේසි කඩ කිරීමක් වශයෙන් අවලංගු කෙරෙනු ඇත.

- මෙම ටෙන්ඩරය සම්බන්ධයෙන් අවසන් තීරණය, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය වේ.

**සභාපති**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව**
**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**